ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Article 11

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2018.05.02 |

පැමිණිලිකරු : එම්.ඩබ්. ජයවීර මයා.
අංක : 76/01. වීර පෙදෙස.
වැව පහළ. පොළොන්නරුව.

වගඋත්තරකරුවන් : ප්‍රධාන පොලිස් පරීක්ෂක ජරුල් මයා.
මූලස්ථාන පොලිස් ස්ථානය.
පොළොන්නරුව.

පැමිණිලි අංකය : **HRC/AP/291/2015**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් තමා 46 හැවිරිදි රජයේ සේවකයෙකු වන බවත්. 2015.06.06 දින යම් කටයුත්තක් සඳහා නිවසින් පිටත් වීමට සූදානම් වූ අවස්ථාවේදී පොළොන්නරුව පොලීසියේ සුසිරිපාල නැමැති පොලිස් නිලධාරියා ඇතුළු නිලධාරීන් පස් දෙනකු පැමිණ පැමිණිලිකරුගේ නිවසේ පිටත හා ඇතුළත සෝදිසි කරන ලද බවත්. එකී සෝදිසි කිරීමෙන් අනතුරුව පොළොන්නරුව පොලීසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක මුණගැසීමට යාම සඳහා ඔවුන් සමඟ පැමිණෙන ලෙස දැනුම් දුන් බවත් සඳහන් කර ඇත. ඒ අනුව එම පොලිස් නිලධාරීන් සමඟ පැමිණිලිකරු පොලිස් ස්ථානයට ගිය බවද. පොලිස් නිලධාරීන් පොලීසියේ කාමරයකට කැඳවාගෙන ගොස් එහි තිබූ ද්‍රව්‍ය සහිත බෝතලයකට සීල් තබා එයට ඇඟිලි සළකුණු තබන ලෙස තමන්ට දැනුම් දුන් බවද. එය තමන්ට අයත් නොවන දෙයක් බැවින් එය ප්‍රතික්ෂේප කළ විට පැමිණිලිකරුට තර්ජණය කර 'HQI එනකං හිටපන්' යැයි කියා සිර මැදිරියට දැමූ බවත්. සඳහන් කර ඇත. පසුව සවස 2.30 - 3.00 ට පමණ පැමිණිලිකරුව වගඋත්තරකාර මූලස්ථාන පොලිස් පරීක්ෂක වෙත රැගෙන ගිය බවද තමාව නොකළ වරදකට හසු නොකරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටි විට 'උඹට නඩු දානවා තමයි. මූව අර කාමරයට ගෙනියන්න' යැයි ප්‍රකාශ කළ බවද දක්වා ඇත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11- 2505580/81/82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2505575<br>1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

ඒ අනුව පැමිණිලිකරුව කලින් රැගෙන ගිය කාමරයට කැඳවා ගෙන ගිය බවද ටික වේලාවකින් වගඋත්තරකරු පැමිණ එම ස්ථානයේ සිටි නිලධාරීන්ට දොරවල් වහන්න කියා පැමිණිලිකරු ලඟට පැමිණ ඔහුගේ කමිසයෙන් ඇද වගඋත්තරකරු විසින් වම් කණටත්. දකුණු කණටත් පහරවල් කිහිපයක් ගසන ලද බවත්. එක් වරම තම කණ නොඇසෙන තත්වයට පත්වූ බවත් පසුව පැමිණිලිකරුගේ කොන්දට වැලිමිටෙන් පහරක් දී බිම දමා පයින් පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත. පසුව පැමිණිලිකරුට නැගිටින්න කියා කොලයක් රැගෙන පැමිණිලිකරුගේ රැකියාව පිළිබඳ විමසා 'තොගේ රස්සාව නැති කරනවා' යැයි කියා සටහනක් තබා පැමිණිලිකරු කූඩුවට දැමීමට නියෝග කළ බවත් දක්වා ඇත.

පැමිණිලිකරු පසුදින එනම්. 2015.06.07 වන දින අධිකරණයට ඉදිරිපත් කළ බවද එදින බන්ධනාගාරගත කිරීමෙන් පසුව 2015.06.09 වන දින ඇප ලබා දුන් බවද ඇප ලබා දෙන අවස්ථාවේදී තමාගේ කණ් ඇසීම දුර්වලව තිබූ නිසා රෝහල්ගත වූ බවද පොළොන්නරුව ශික්ෂණ රෝහලේ දින 04ක් ප්‍රතිකාර ලැබූ බවද වෛද්‍ය වාර්තාවලට අනුව පැමිණිලිකරුගේ කණ් බෙරයට හානි සිදුව ඇති බවට ප්‍රකාශ කරන ලද බවද සඳහන් කර ඇත.

ඉහත කී පැමිණිල්ලට අදාළ වගඋත්තර පාර්ශවය වෙතින් පිළිතුරු වාර්තා සහ පොළොන්නරුව ශික්ෂණ රෝහල වෙතින් පැමිණිලිකරුට අදාළ වෛද්‍ය වාර්තාවද කොමිෂන් සභාව විසින් කැඳවා ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

වගඋත්තරකරු විසින් පැමිණිලිකරු ඔහුගේ පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇති වම් කණට හා දකුණු කණට පහරදීමෙන් කණ නොඇසෙන තත්වයට පත්වීම සහ ඒ සඳහා ප්‍රතිකාර ගැනීමට දින 04 ක් රෝහල්ගතවීමට සිදුවීම යන චෝදනා ප්‍රතික්ෂේප කර ඇත.

ඉහත පැමිණිලිකරු විසින් පොළොන්නරුව බීජ ගොවිපල පිටුපස ඇති කැලෑ ප්‍රදේශයේ නීති විරෝධී මත්පැන් පෙරීමට සූදානම් වන බවට පොලීසියට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකළ බවත්. වගඋත්තරකරු ඇතුළු කණ්ඩායම එම ස්ථානය වටලන විට පැමිණිලිකරු එම ස්ථානයේ තිබූ නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගොඩා බැරලයක් විවෘත කරමින් යමක් කරමින් සිටි බවත්. තම කණ්ඩායම දුටු විට එම ස්ථානයෙන් පැන ගිය බවත්. නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා බැරලය නඩු භාණ්ඩයක් ලෙස ගෙන පසුව පැන ගිය සැකකරුව ඔහුගේ නිවසේදී අත්අඩංගුවට ගෙන පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී 753/15 යටතේ ඉදිරිපත් කිරීමෙන් පසු 2015.06.09 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කළ බවද දක්වා ඇත.

තවද මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු දිගින් දිගටම නීති විරෝධී මත්පැන් පෙරීම හා අළෙවි කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින පුද්ගලයෙකු වන බවද. ඔහු පුරුද්දක් වශයෙන් ඉහත කී නීතිවිරෝධී ක්‍රියා සිදුකිරීම මගින් ප්‍රදේශයේ සාමකාමී වාතාවරණයට හානි පමුණුවනු ලබන

තැනැත්තෙක් බවද වගඋත්තරකරු ප්‍රකාශ කර ඇති අතර පැමිණිලිකරු අධිකරණයේ වරදකරු වී ඇති නඩු 10 ක් පිළිබඳ විස්තරද ඔහුට එරෙහිව දැනට විභාග වන නඩු 03 ක් පිළිබඳ තොරතුරුද මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

විමර්ශනය :-

මෙම පැමිණිල්ලට අදාළ විමර්ශන කටයුතු වලදී මූලික අවධානය යොමු කර ඇත්තේ පැමිණිලිකරුට සිදුකර ලදැයි සඳහන් පහරදීම සම්බන්ධයෙන් වේ. නීති විරෝධී මත්පැන් පෙරීමේ උපකරණ ලඟ තබා ගැනීම පිළිබඳව පැමිණිලිකරුට එරෙහිව ගොනුකර ඇති නඩුව අධිකරණයේදී විභාග වන හෙයින්ද, පැමිණිලිකරුට එහිදී කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාවක් පවතින හෙයින් ද, ඒ පිළිබඳව වැඩිදුරටත් විමර්ශන සිදු කර නොමැත.

පැමිණිලිකරුට සිදුකරන ලදැයි සඳහන් පහරදීමේ චෝදනා සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කිරීමේදී එය තහවුරු කිරීම සඳහා උපයෝගී කරගත හැකි මූලික සාක්ෂි වන්නේ ඇසින් දුටු සාක්ෂි සහ අධිකරණ වෛද්‍ය වාර්තා වේ.

පැමිණිලිකරුට සිදුකරන ලද පහරදීම පොලිස් ස්ථානය තුළදී කාමරයක් තුළ වගඋත්තරකරු විසින් සිදුකරන ලද නිසා ඇසින් දුටු සාක්ෂි කිසිවක් නොමැති බව පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් ප්‍රකාශ කර ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාව :-

පැමිණිලිකරුට අදාළ අංක 1358/15 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව 2015.06.10 දිනැතිව පොළොන්නරුව ශික්ෂණ රෝහලේ වෛද්‍ය එම්.ඒ සුරේන් පෙරේරා මහතා විසින් නිකුත් කර ඇති අතර එම වාර්තාවට අනුව පැමිණිලිකරුව 2015.06.09 දින ඇඳ ඉහපත් අංක 44135 යටතේ වාට්ටු අංක 18 හි ඇතුළත් කර 2015.06.12 දින රෝහලෙන් පිටකර ඇති බවට දක්වා ඇත. එහි අංක සි යටතේ තුවාල පිළිබඳ නිරීක්ෂණ සටහන් කරමින් තුවාල දෙකක් පවතින බවට දක්වා ඇත. එනම්.

01. වම් ඇසට පහළින් තැලීම් ස්වභාවයක් (contusion (fain) on left in infraorbital area) සහ

02. වම් කණේ කර්ණපහට පටලය සිදුරුවීමක් පවතින බවට (Left sided traumatic tympanic membrane (ear drum) perforation) දක්වා ඇත.

එසේම රෝගියා විසින් දෙන කෙටි ඉතිහාසය (බී) තුළ පැමිණිලිකරුට වගඋත්තරකාර මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා විසින් වම් කණට ගහගෙන ගහගෙන ගොස් බිම දමා පයින් ගැසූ බවට සහ කොන්දට වැලිම්ටෙන් අනින ලද බවට ප්‍රකාශ කර ඇති බවද සඳහන් කර ඇත.

තවද, අධිකරණ වෛද්‍ය මතය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කිරීමේදී රෝගියා විසින් දෙන ලද ඉතිහාසය සහ නිරීක්ෂණය වී ඇති තුවාල එකිනෙක සැසඳෙන බවට දක්වා ඇති අතර එසේම වම් කණේ ඇසීමේ තත්වය දුර්වල වී ඇති බවත් එය යථාතත්වයට පත්වීම පිළිබඳව නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි බවත් දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරුව 2015.06.06 දින අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂනය වන අතර එකී අත්අඩංගුවට ගන්නා ලද ආකාරය පිළිබඳව පැමිණිලිකරු විසින් සිදුකරන ප්‍රකාශයන් නිවැරදි ද වගඋත්තරකරු විසින් සිදුකර ඇති ප්‍රකාශයන් නිවැරදිද යන්න සනාථ කර ගැනීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී නොමැත.

පැමිණිලිකරුව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කර ඇති අතර ඇප ලබා දී ඇත්තේ, 2015.06.09 දින වේ. එදිනම පැමිණිලිකරු රෝහල්ගතව ඇත. පැමිණිලිකරුට පහරදීමක් සිදුකරනු ඇසින් දුටුවෙකු වෙතින් සාක්ෂි ඉදිරිපත් වී නොමැති අතර පොලිස් ස්ථානය තුළදී පහරදීමක් සිදුකරන ලද බවට පැමිණිල්ලෙන් දක්වා ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව පැමිණිලිකරුගේ වම් ඇසට පහළින් තැලීමක්ද, වම් කණේ කර්ණපටහ පටලය සිදුරුවීම හේතුවෙන් ඇසීමේ තත්වය දුර්වල වීමක්ද පෙන්වා දී ඇත.

**නිගමනය :-**

වගඋත්තරකරු විසින් පැමිණලිකරුට සිදුකරන ලදැයි සඳහන් පහරදීම සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි ඉදිරිපත් වී නැතත්, පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණුද, අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති ප්‍රකාශයද සැළකිල්ලට ලක්කිරීමේදී එකී පහරදීම පිළිබඳ ප්‍රකාශයන් විශ්වාසනීය ප්‍රකාශයන් ලෙසට නිගමනය කළ හැක.

තවද අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් වී ඇති කරුණු වලට අනුව වගඋත්තරකරුගේ පහරදීම මඟින් පැමිණිලිකරු වධහිංසාවට ලක් වී ඇති බවත්, ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් තහවුරු කර දී ඇති මූලික අයිතිවාසිකම වන 'කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික සැළකිල්ලකට හෝ දඬුවමකට යටත් නොවිය යුත්තේය' යන මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. වගඋත්තරකාර මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා විසින් පැමිණිලිකරු වෙත රු. 25,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

2. වගඋත්තරකරු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමුකරනු ලැබේ.

2018.06 .02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව
නො 14,

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

පිටපත :- පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

B/